සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

23051

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 33 | S | I

නම: ........................................ | ඉතිහාසය I | කාලය පැය එකයි

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 හිමිවේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් වැදගත් කෘතියක් වන නිකාය සංග්‍රහයෙන් හෙළිවන්නේ,
   1. ආර්ථිකය පිළිබඳව ය.
   2. සමාජය පිළිබඳව ය.
   3. දේශපාලන කටයුතු පිළිබඳව ය.
   4. ශාසන ඉතිහාසය පිළිබඳව ය.

02. අනුරාධපුර මහා විහාරයේ අනුබද්ධ පිරිවෙනක් වන්නේ,
   1. සුනේත්‍රාදේවි පිරිවෙන.
   2. එල්ලග්ග පිරිවෙන.
   3. පද්මාවතී පිරිවෙන.
   4. සත්‍යානන්ද පිරිවෙන.

03. රටේ ඉතිහාසය හැදෑරීමෙන් ලැබිය හැකි වඩාත් වැදගත් ප්‍රයෝජනය මින් කුමක් ද?
   1. රටේ අඛණ්ඩ දේශපාලන ඉතිහාසය අධ්‍යනය කිරීම.
   2. අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම්ගෙන අනාගතය ගොඩනැගීම.
   3. මානව වර්ගයාගේ විකාශය පිළිබඳ හැදෑරීම.
   4. විදේශ සම්බන්ධතා හා ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු සිදුවූ අයුරු හඳුනා ගැනීම.

04. ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සැලකෙන කාසි සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.
   1. දේශීය කාසි වලට අමතරව ශ්‍රී ලංකාවෙන් විදේශ කාසි හමු වේ.
   2. ආර්ථික තත්ත්වය, වෙළඳාම පිළිබඳ හැදෑරීමට මේවා වැදගත් වේ.
   3. අඛණ්ඩ දේශපාලන ඉතිහාසයක් ගොඩනගා ගැනීමට කාසි වැදගත් වේ.
   4. අතීත ලෝහ භාවිතය පිළිබඳ හැදෑරීමට මේවා ප්‍රයෝජනවත් වේ.

05. ගල් යුගයේ අභිචාර විධි අතර නවා එකුටුකර වළලා තිබුණු ඇට සැකිලි සොයාගත් ලෙන වන්නේ,
   1. බුලත්සිංහල පාහියන්ගල ලෙන.
   2. කුරුවිට බටදොඹ ලෙන.
   3. බදුල්ල රාවනා ඇල්ල ලෙන.
   4. කිතුල්ගල බෙළි ලෙන.

06. පූර්ව ඓතිහාසික යුගයේ සිදුවූ තාක්ෂණික දියුණුවක් ලෙස සැලකිය හැක්කේ,
   1. කෘෂිකාර්මික දිවිපෙවෙතකට නැඹුරු වීම.
   2. ස්ථිර ජනාවාස ඇතිකර ගැනීම.
   3. අවමංගල්‍ය චාරිත්‍ර අනුගමනය කිරීම.
   4. ලෝහ භාවිතයට නැඹුරු වීම.

07. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යාප්තිය පිළිබඳ වූ අවබෝධයක් ලබා ගැනීමට වැදගත්වන සාධකය මින් කුමක් ද?
   1. ගම්වැව්වල ව්‍යාප්තිය.
   2. තැනිතලා බිම්වල ව්‍යාප්තිය.
   3. වාර්ෂික වර්ෂාපතනය.
   4. රතු දුඹුරු පස්වල ව්‍යාප්තිය.

08. වැව් ප්‍රපතනය හෙවත් "එල්ලංගාව" ලෙස හඳුන්වනු ලැබුවේ කුමක් ද?
   1. වැවක ජලය සංරක්ෂණය කිරීමයි.
   2. වැව අවට බිම තෙතමනයෙන් නැබීමට සැලකිලිමත් වීමයි.
   3. වැව් කිහිපයක් ඇළ මාර්ග මගින් සම්බන්ධ කිරීමයි.
   4. ගම්මාන කිහිපයකට එක වැවක් නිර්මාණය කිරීමයි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

09. විවිධ දක්ෂතා තිබූ පරුමකවරුන්ගේ සහය ගෙන එතෙක් විමධ්‍ය ගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කල ලංකාවේ ප්‍රථම රජතුමා කවු ද?
1. පණ්ඩුකාභය රජු 2. දුටුගැමුණු රජු 3. මහා විජයබාහු රජු 4. භාතිකාභය රජු

10. පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතරින් පළමුවන විජයබාහු රජතුමා හා සම්බන්ධ සිදුවීම් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.
A. පළමුවර මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම.
B. කුමරුටත්, රාජකීය පවුලටත්, රුහුණේ වාසය කළ රජයේ නිලධාරියෙක් රැකවරණය සැලසීම.
C. රෝමය සමග සම්බන්ධතා පැවැත්වීම.
D. සටන් ව්‍යාපාරයක් මඟින් චෝලයන් පරදවා රට එක්සත් කිරීම.
E. මේ රජු හැඳින්වීමට සෙල් ලිපියක "අලකපය මහරජ" යන යෙදුම භාවිත කර තිබීම.
F. අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය කරගැනීම.
1. ABD 2. BDF 3. CEF 4. DCF

11. ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට හිමි වූ අවස්ථාවකට හොඳම නිදසුන වන්නේ,
1. වසභ රජුගෙන් වංකනාසික තිස්ස රජුට 2. පණ්ඩුකාභය රජුගෙන් දේවානම්පියතිස්ස රජුට
3. කාවන්තිස්ස රජුගෙන් සද්ධාතිස්ස රජුට. 4. දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස රජුට.

12.
1. vi කාශ්‍යප රජු
2. i උපතිස්ස රජු
3. v මිහිඳු රජු
4. බුද්ධදාස රජු

A. ශ්‍රී ලංකාවේ නොයෙකුත් පළාත්වල තිබූ රෝහල්වල අවශ්‍ය සියලු දේ ලබාදීම
B. සොත්ථි ශාලා ඉදිකිරීම
C. උපසග්ග රෝග නාස
D. රෝහල් ඉදිකිරීම
E. පසවත්තිනාම ශාලා

1. AEDC 2. BACD 3. CEAD 4. DCBE

13. සෙල්ලිපිවල වාපර, ලපන, වෙජ, වොහාර වශයෙන් දක්වා ඇති පුද්ගලයින් හැඳින්වෙන නම් අනුපිලිවෙලින් සඳහන් වන පිළිතුර තෝරන්න.
1. වෛද්‍යවරුන්, වෙළෙන්දන්, චිත්‍ර ශිල්පීන්, නීති විශාරදයන්
2. වෙළෙන්දන්, චිත්‍ර ශිල්පීන්, වෛද්‍යවරුන්, නීති විශාරදයන්
3. චිත්‍ර ශිල්පීන්, වෛද්‍යවරුන්, නීති විශාරදයන්, වෙළෙන්දන්
4. වෛද්‍යවරුන්, චිත්‍ර ශිල්පීන්, නීති විශාරදයන්, වෙළෙන්දන්

14. ධර්මය ඉතා පුළුල් බැවින් ඉන් කොටස බැගින් මතකයේ තබා ගත් භික්ෂූන්වහන්සේලා හැඳින්වූයේ,
1. භාණකවරු 2. සද්ධිවිහරිය 3. අන්තේවාසික 4. ථෙර

15. අනුරාධපුරයේ විසූ පර්සියානු ජාතික වෙළඳුන් කණ්ඩායමක් ගැන සඳහන් කරන දේශාටකයකු වන්නේ,
1. ඉබන් බතූතා 2. ඉබ්න් ශහ්රියර්
3. කොස්මස් ඉන්ඩි කොප්ලෙස්ටස් 4. අල්බලශූරී

16. රජරට ශිෂ්ටාචාර සමයට අයත් සාහිත්‍ය කෘති අතරින් සංස්කෘත භාෂාවෙන් රචිත කෘතිය වන්නේ කුමක්ද?
1. සාරප්ථදීපනී 2. ජනකීහරණය 3. සසදාවත 4. දීපවංශය

17. සුළඟ නිසා ඇතිවන ජල තරංග මගින් වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීම සඳහා ඉදිකර ඇති අංගය මින් කුමක් ද?
1. බිසෝකොටුව 2. සොරොව්ව 3. දියකැට පහන 4. රළපනාව

18. අපේ රටේ පැරැන්නන් කෙටි දුර මැනීම සඳහා භාවිත කල මිමි වන්නේ,
1. වියත , උසබ 2. ආංගුලය, වියත 3. ගව්ව, යොදුන 4. වියත, යොදුන

19. "මතෙර මජ්ඣක" නැමති බදු වර්ගය අය කරනු ලැබුවේ මින් කුමක් සඳහා ද?
1. හේන් වගාකිරීම 2. වැව්වල ජලය භාවිතා කිරීම
3. ඇළ මාර්ග වල මත්ස්‍යන් ඇල්ලීම 4. රජුට අයත් ඉඩම්වල වගා කිරීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CS CamScanner

20. පහත සඳහන් නීති අතරින් පරිසර සංරක්ෂණය හා සම්බන්ධ වධාන්ම වැදගත් නීතිය කුමක් ද?.
1. වැව් වලින් ජලය ලබාගන්නා කුඹුරු වල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතුය.
2. ජලාශ වල ජීවත්වන ජීවීන් නොමැරිය යුතුය.
3. මී හරකුන්, එළ හරකුන් හා එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැමිණ විය යුතුය.
4. උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතුය.

21. ● රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස රාජ්‍ය කටයුතු කිරීම. ● කෝට්ටේ බලකොටුවක් නිර්මාණය කිරීම.
● ආර්ය චක්‍රවර්තී රජුගේ බදු නිලධාරීන්ට දඬුවම් කිරීම. සම්බන්ධ තැනැත්තා
1. වීර අලකේශ්වර
2. අම්බුළුගල කුමරු
3. සේනාලංකාධිකාරී සෙනවි
4. නිශ්ශංක අලගක්කෝනාර

22. පහත "අ" තීරුවේ සඳහන් සාහිත්‍ය කෘති "ආ" තීරුවේ ඇති රාජධානි යුගයන්ට අදාලව නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. දළදා සිරිත | A. පොළොන්නරුව |
| 2. ගුත්තිල කාව්‍ය | B. දඹදෙණිය |
| 3. කව් සිළුමිණ | C. කුරුණෑගල |
| 4. සද්ධර්මාලංකාරය | D. ගම්පොල |
| | E. කෝට්ටේ |

1. ABDC 2. BECD 3. CBDE 4. CABD

23. පස් යොදුන් රටේ "සිංහල සටගෙ" නමින් කැරැල්ලක් ඇති වූයේ කවර රාජ්‍ය සමයකද?
1. iv පරාක්‍රමබාහු රජු 2. vi බුවනෙකබාහු රජු 3. iii පරාක්‍රමබාහු රජු 4. ii බුවනෙකබාහු රජු

24. යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාවේ කුමන වෙළඳ ද්‍රව්‍යයක් ලබාගැනීම සඳහා දැඩි තරඟයක නිරත වීද?
1. මැණික් 2. පුවක් 3. කුරුඳු 4. ඇත්දළ

25. පහත දක්වෙන තොරතුරු අතරින් පළමුවන විමලධර්මසූරිය රජුට පමණක් අදාළ වන්නේ,
A. කුසුමාසන දේවිය විවාහ කර ගැනීම.
B. දන්තුරේ සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත් කිරීම.
C. රන්දෙණිගල සටනට නායකත්වය දීම.
D. පෘතුගීසීන් මෙරටින් පන්නා හැරීම.
1. A හා B ය 2. A හා D ය. 3. B හා C ය. 4. C හා D ය.

26. පෘතුගීසීන් උඩරට යටත් කර ගැනීම සඳහා කල සටන් වලදී කොන්ස්තන්තීනු ද සා මෙහෙය වූයේ,
1. දන්තුරේ සටනයි. 2. බලන සටනයි. 3. රන්දෙණිගල සටනයි. 4. ගන්නෝරුවේ සටනයි.

27. මහනුවර රාජධානියේ නීත්‍යානුකූල අයිතිය ඉංග්‍රීසීන් තහවුරු කරනු ලැබුවේ,
1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්ලා ගැනීමෙනි.
2. රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකරුගේ ආක්‍රමණය මඟිනි.
3. 1815 උඩරට ගිවිසුම මඟිනි.
4. 1818 ප්‍රකාශය නිකුත් කිරීම මඟිනි.

28. කෝල්බෲක් කොමිසම මඟින් ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද යෝජනාව කුමක් ද?
1. දිවයින පළාත් හතකට බෙදීම.
2. ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම.
3. උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයක් හඳුන්වා දීම.
4. රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.

29. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ඉදිරිපත් කළ යෝජනා ඇතුළත් පිළිතුර තෝරන්න.
A. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් පිරිස බහුතරයක් වීම.
B. උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයකු ව්‍යවස්ථාදායක සභාවට පත් වීම.
C. සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම.
D. විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම.

1. A හා D ය 2. B හා C ය 3. C හා D ය 4. B හා D ය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

30. කාර්මික විප්ලව සමයේ විවිධ විෂයන් වල නව නිපැයුම් කරුවෝ බිහිවූ අතර ඔවුන්ගෙන් කිහිපදෙනෙකු පහත දක්වේ. යකඩ හා වානේ කර්මාන්තයේ දියුණුවට දායක වූවන් ඇතුළත් පිළිතුර කුමක් ද?

A. එබ්‍රහම් ඩර්බි.
B. හෙන්රි බෙසමර්.
C. හම්ෆ්‍රි ඩේවි.
D. ජෝන් කේ.

1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. A හා C ය.

31. පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වැදගත් වෙනස මින් කවරේ ද?
1. රජවරු පාලන කටයුතු වලදී මධ්‍යම පන්තියේ සහය කර ගැනීම.
2. ජාතිකත්ව සංකල්පය වර්ධනය වීම.
3. සියලු බලතල රජු වටා කේන්ද්‍ර ගත වීම
4. ප්‍රාදේශීය රාජ්‍ය එක්සත් කිරීම.

● පහත සඳහන් ABCD ලෙස දක්වා ඇති යුගල අධ්‍යනය කර 32 සිට 34 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. 1. සමාජ සම්මුතිය
2. ප්‍රංශ විප්ලවය

B. 1. මෙන් ෂෙවික්වරු
2. ඇමරිකා එක්සත් ජනපදය

C. 1. රුසියන් විප්ලවය
2. බොල්ෂෙවික් පක්ෂය

D. 1. වර්ජිනියා
2. ජෝර්ජියා

32 පළමුවැන්නේ ආරම්භය හා දෙවැන්නේ අවසානය පෙන්වන යුගලය
1. A 2. B 3. C 4. D

33. දෙවැන්නේ වර්ධනයට පළමුවැන්න හේතු වූ පද යුගලය
1. A 2. B 3. C 4. D

34. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නොපෙන්වන පද යුගලය,
1. A 2. B 3. C 4. D

* පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 35 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
A. "උදය භානු" පුවත් පත ඇරඹීම.
B. වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත්කරගැනීමට කටයුතු කිරීම.

35. ආරුමුගර් නාවලර්තුමා සම්බන්ධයෙන් ,
1. A හා B සත්‍ය වේ.
2. A හා B අසත්‍ය වේ.
3. A සත්‍යවන අතර B අසත්‍ය වේ.
4. A අසත්‍යවන අතර B සත්‍ය වේ.

36. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පොල්ගොල්ල හැරවුමෙන් සුදු ගඟට එකතුවන ජලය වියලි කලාපීය වැව් වලට බෙදා හැරීම සිදුවන්නේ කුමන ජලාශයට එකතු වීමෙන් පසුව ද ?
1. කොත්මලේ. 2. වික්ටෝරියා. 3. බෝවතැන්න. 4. පොල්ගොල්ල.

37. පහත දැක්වෙන A සිට D දක්වා ඇති ක්‍රියාකාරකම් හා සම්බන්ධ යුරෝපීය පාලකයා කවුද?
A. මගේ සටන නමැති කෘතිය රචනා කිරීම.
B. "ගෙස්ටා පෝ" නමැති රහස් පොලීසිය පවත්වාගෙන යාම.
C. යුදෙව්වන් විනාශ කිරීම.
D. පෝලන්තය ආක්‍රමණය කිරීම.

1. බෙනිටෝ මුසෝලිනි.
2. ඔටෝ වොන් බිස්මාක්.
3. II විලියම් කෛසර්.
4. ඇඩොල්ෆ් හිට්ලර්.

38. දෙවන ලෝක යුද්ධයෙන් පසුව තම දේශපාලන බලය කඳවුරේ සාර්ථකත්වය උදෙසා යුධ මැදිහත් වීමකින් තොරව විවිධ උපක්‍රම යොදා ගනිමින් කටයුතු කිරීමේ න්‍යාය හඳුන්වන නම කුමක් ද?
1. නිරවි යුද්ධය
2. ආර්ථික සම්බාධක පැනවීම
3. න්‍යෂ්ටික අවි සීමා පැනවීම
4. සාම සාධක හමුදා යෙදවීම.

39. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් වලට හිමි විශේෂ වරප්‍රසාදය වන්නේ
1. අවුරුදු පහකට වරක් මහලේකම්වරයෙකු පත් කිරීමට ඇති හැකියාව
2. කිසියම් යෝජනාවක් සම්බන්ධයෙන් නිෂේධ බලය පාවිච්චි කිරීමට ඇති හැකියාවයි.
3. විපත් වලට මුහුණ දුන් සාමාජික රටවලට මානුෂික ආධාර අනුමත කිරීමට ඇති බලයයි.
4. ගැටුම් පවතින සාමාජික රටවලට හමුදා යැවීමට ඇති හැකියාවයි.

40. නොබැඳි ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කළ මිසර ජනාධිපතිවරයා
1. ශ්‍රී ජවහල්ලාල් නේරු 2. මාෂල් ටිටෝ 3. බැන්කිමුන් 4. අබ්දුල් ගමාල් නසාර්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம் 23050
Department of Education Central Province

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 33 | S | II

නම: ........................................ | ඉතිහාසය II | කාලය පැය තුනයි

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදා ගන්න.
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

සැලකිය යුතුයි :
- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II වන කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද, පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
වික්ටෝරියා , ගම්පොල, දඹකොලපටුන, කලා වැව, මාතොට, මීගමුව,
ලංකාපටුන, ගොඩවාය, කැළණිය, ගල්ඔය, පාහියන්ගල, එලිෆන්ට්පාස් (ල. 12)

ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
පර්සියන් බොක්ක, මලක්කා සමුද්‍රසන්ධිය, හිරෝෂිමා, වැනීසිය, සුවස් ඇළ, කල්කටා (ල. 06)

(ආ) i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
A -මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගත් තැනැත්තා.
B - විසිවතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජතාන්ත්‍රික දූත ගමන් සිදුවන විට මෙරට රජතුමා
C - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ සිටි ජපන් අධිරාජයා
D - ක්‍රි.ව. 1915 වර්ෂයේ සිංහල මුස්ලිම් කෝලාහලය සමයේ දී නඩු විභාගයකින් තොරව සිරභාරයට පත්කළ නායකයන් නිදහස් කර ගැනීමට උද්යෝගිමත් මෙහෙවරක් ඉටුකළ තැනැත්තා (ල. 04)

- A හා B යටතේ දක්වා ඇති රූප අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

ii.1. A රූපය නම් කරන්න.
2. කුමන කාර්යයක් සඳහා මෙය යොදා ගනු ලැබුවේ ද?
3. මෙම නිර්මාණය සඳහා යොදාගෙන ඇති මාධ්‍ය කුමක් ද?
4. මෙම නිර්මාණය හමු වී ඇත්තේ කුමන ස්ථානයකින් ද?
(ල.04)



A රූපය

iii.1. B රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. ඔහු විසින් බිහි කරන ලද රට නම් කරන්න.
3. 1870 ඔහු විසින් පරාජය කරන ලද රට කුමක් ද?
4. එම රටින් ඔහු සතු කරගත් සාරවත් ප්‍රදේශ දෙක නම් කරන්න.
(ල. 04)



B රූපය



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CS CamScanner

## II කොටස

(02) i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයන් හා සම්බන්ධයෙන් මිනිස් ඇට සැකිලි සොයාගත් ස්ථාන A,B,C පිළිවෙලින් නම් කරන්න.

A - පුද්ගලයින් දොළොස් දෙනෙකුගේ ඇට සැකිලි සොයාගත් ලෙන

B - පුද්ගලයින් නව දෙනෙකුගේ ඇට සැකිලි සොයාගත් ලෙන (ල. 03)

C - පුද්ගලයින් තිස් දෙනෙකුගේ ඇට සැකිලි සොයාගත් ලෙන

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි සැළකෙන කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන පැවති ස්ථාන (ල. 04) **දෙකක්** සහ ගල්ගුහා වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** නම් කරන්න.

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධි ගැන තරමක් හෝ පැහැදිලි තොරතුරක් ලැබෙන්නේ මිනී වැළලීම් සම්බන්ධයෙනි. එසේ මිනී වැලලීම සම්බන්ධයෙන් සාක්ෂි හමුවන ස්ථාන **දෙකක්** නම් කර එම ස්ථාන වල මිනී වැළලීම සම්බන්ධව චාරිත්‍ර විධි පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 05)

iv. ඓතිහාසික යුගයේ පැවති ආර්ථික රටාව තුළ කෘෂිකර්මය සංවිධාන වී තිබූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල.06)

(03) i. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත විමෙන් පසු ගොඩ නැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් පහත සදහන් කාර්යයන් හා සම්බන්ධ පුද්ගලයන්ගේ තිල නාමයන් **අනුපිළිවෙලින්** ලියා දක්වන්න.

A - නාගරික වාස්තු විද්‍යාඥයා. B - වෙළඳ කටයුතු භාර ප්‍රධානියා. C - රාජ්‍ය ලේඛණාගාර ප්‍රධානියා. (ල. 03)

ii. පහත සඳහන් රාජ්‍යත්ව සංකල්පවලට අදාළ පාලකයන් වරහන් තුළින් තෝරා A,B,C හා D පිළිවෙලින් ලියා දක්වන්න.

A - දේවත්ව B - චක්‍රවර්ති

C - තථේශ්වර D - ආලකමන්දාධිපති

(පළමුවන කාශ්‍යප, වසභ, නිශ්ශංකමල්ල, කුඨණ්ණඅභය, මහසෙන්, දුටුගැමුණු, ධාතුසේන, හතරවන කාශ්‍යප) (ල. 04)

iii. පළමුවන විජයබාහු රජතුමා මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 05)

iv. මෙරට අතීතයේ ගමක පාලන කටයුතු සිදු කිරීමේ දී එහි නායකත්වය ගත් තැනැත්තා සහ ඔහුගේ කාර්යයභාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 06)

(04) I. පහත දක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා කරන ලද නිර්මාණ **පිළිවෙලින්** ලියන්න.

A- ජල පීඩනය සමනය කොට ඇළට ජලය නිකුත් කිරීමට භාවිත කළ තාක්ෂණික නිර්මාණය

B- ගංගාවක ජලය වෙනතකට හැරවීම සඳහා ඉදිකළ බැම්ම.

C- ජල තරංග වලින් වැව් බැම්ම සේදීයාම වැළැක්වීමට . (ල. 03)

ii. පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ නිර්මාණ අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A- පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම.

B- පදම්කල මැටි වලින් භාණ්ඩ සාදා ගැනීම

C- උස් ගොඩනැගිලි අකුණු අනතුරු වලින් ආරක්ෂා කර ගැනීම

D- යකඩ නිස්සාරණය (ල. 04)

iii. ශ්‍රී ලංකාවේ පැරණි සමාජය පරිසර සම්පත් සංරක්ෂණය කිරීමේ දී අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව අවධානය යොමු කළ බව නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ල. 05)

iv. ගෘහ නිර්මාණ කටයුතු වලදී අතීත ශිල්පීන් දක්වූ කුසලතාවය පිළිබඳ කරුණු **තුනක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ල. 06)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources
CS CamScanner

(05) i. කාලිංග මාඝ රජරට පාලනය කළ සමයේ දිවයිනේ සෙසු ප්‍රදේශවල පාලනය ගෙන ගිය ප්‍රාදේශීය පාලකයින් තම මධ්‍යස්ථාන ලෙස තෝරා ගත් ස්ථාන **තුනක්** නම් කරන්න. (ල. 03)

ii. පහත A,සිට D දක්වා ඇති ඓතිහාසික සිද්ධිවලට සම්බන්ධ රජවරුන් වරහන් තුළ දක්වා ඇති නම් අතරින් තෝරා **පිළිවෙලින්** ලියන්න.

A - පන්සිය පනස්ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
B - ගඩලාදෙණි විහාරය
C - ජෝතිය සිටුවරයා ඇතිකළ කැරැල්ල මැඩපැවැත්වීම.
D - කවි සිළුමිණ රචනා කිරීම.

(පළමුවන බුවනෙකබාහු, දෙවන බුවනෙකබාහු, සිව්වන බුවනෙකබාහු, දෙවන පරාක්‍රමබාහු, තුන්වන පරාක්‍රමබාහු, සිව්වන පරාක්‍රමබාහු, පස්වන පරාක්‍රමබාහු, සයවන පරාක්‍රමබාහු) (ල. 04)

iii. ගම්පොල රාජධානියේ ස්වාධීනත්වයට හානි කරවූ දේශීය හා විදේශීය ආක්‍රමණ සිදු වූ බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ල. 05)

iv. දෙවන නාගරීකරණ සමයේ දී මෙරට

A - ආගම
B - ගෘහ නිර්මාණ ශිල්පය

යන ක්ෂේත්‍රවල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ **එක බැගින්** දක්වමින් විස්තර කරන්න. (ල. 06)

(06) i. පහත සඳහන් සිදුවීම හා සම්බන්ධ පුද්ගලයින් A,B,C **අනුපිළිවෙලින්** දක්වන්න.

A - ක්‍රි.ව. 1803 ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා උඩරටට විරුද්ධව මෙහෙය වූ ආක්‍රමණය සිදු වූ අවධියේ උඩරට පාලනය කළ රජතුමා
B - ඓතිහාසික උඩරට ගිවිසුමට අත්සන් කිරීමට පෙර බ්‍රිතාන්‍ය ධජය එසවීමට විරුද්ධත්වය පළ කොට යළි සිංහ ධජය එසවීමට ක්‍රියාකළ භික්ෂූන් වහන්සේ
C - 1815 ගිවිසුමට අත්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා (ල. 03)

ii. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව අල්ලා ගැනීමට උනන්දුවක් දැක්වීමට බලපෑ හේතු **දෙකක්** දක්වන්න. (ල. 04)

iii. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සිදු වූ සමාජමය වෙනස්කම් **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ල. 05)

iv. ශ්‍රී ලංකාවේ වී වගාව දියුණු කිරීම සඳහා නිදහසින් පසුව ගන්නා ලද ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ල. 06)

(07) i. ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය හෙබවූ පුද්ගලයන් තිදෙනෙක් නම කරන්න. (ල. 03)

ii. පහත A,B,C හා D වලින් දැක්වෙන තොරතුරු වලට අදාළ **පුද්ගල නාම** වරහන් තුළින් තෝරා **අනුපිළිවෙලින්** ලියන්න.

A - නිදහස් අධ්‍යාපනයේ පියා
B - ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමික විධායක ජනාධිපති
C - ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භකයා
D - මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රථම අමාත්‍යවරයා

(ඩී.එස්. සේනානායක, ගාමිණී දිසානායක, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර, ජේ.ආර්. ජයවර්ධන, විලියම් ගොපල්ලව, සෝල්බරි සාමි, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක) (ල. 04)

iii. පහත නම් සඳහන් අයගෙන් දෙදෙනෙකු තෝරා ගෙන ඔවුන්ගේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට සිදු වූ සේවාවන් විස්තර කරන්න.

A - අනගාරික ධර්මපාල
B - ආරුමුග නාවලර්
C - එම්.සී. සිද්දි ලෙබ්බෙ (ල. 05)

iv. 1978 ව්‍යවස්ථාවට අදාළ මූලික අයිතිවාසිකම් **තුනක්** දක්වා ඒවා කඩ වූ අයෙකුට එම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CS CamScanner

## III - කොටස

(08) i. පුනරුද සමයේ විශිෂ්ට කලා නිර්මාණ ඉදිරිපත් කළ චිත්‍ර ශිල්පීන් **තිදෙනෙකු** නම් කරන්න. (ල. 03)

ii. A - බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයන් ඇති බව සොයා ගැනීම.
B - සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යාවටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව සොයා ගැනීම.
C - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම.
D - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම.
සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි **පිළිවෙලින්** නම් කරන්න. (ල. 04)

iii. නව වෙළඳ මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට බලපෑ **සාධක දෙකක්** විස්තර කරන්න. (ල. 05)

iv. ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කිරීමට කාර්මික විප්ලවය දායක වූ ආකාරය ඊට අදාළ නව සොයා ගැනීම් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 06)

(09) i. බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකානුවන්ට පනවන ලද බදු පනත් **තුනක්** නම් කරන්න. (ල. 03)

ii. පහත අසා ඇති තොරතුරු **අනුපිළිවෙලින්** ලියා දක්වන්න.
A - ප්‍රංශ විප්ලව සමයේ ලුණු වලින් අයකළ බද්ද
B - " මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත." යන ප්‍රකාශය කළ තැනැත්තා
C - ජනතා ස්වාධිපත්‍යය සංකල්පය ඉදිරිපත් කළ තැනැත්තා
D - රුසියාවේ 1917 මාර්තු විප්ලවයේ බලය ලබාගත් සටන්කාමියා (ල. 04)

iii. පළමු ලෝක යුද්ධයට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ල. 05)

iv. ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පිහිටු වූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ල. 06)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CS CamScanner